Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - පෙරදිග සංගීතය

සතිය - 24 වන සතිය

ශ්‍රේණිය - 07

සැකසුම - පුෂ්පා දමයන්ති මිය
ර/ බළ/රජවක විද්‍යාලය

## ළමා ගීත අගය සහ ගීතයේ ප්‍රබලතාවය.

**ගුවන්විදුලිය,රූපවාහිනිය වැනි විවිධ ශ්‍රව්‍ය මාධ්‍යයන් තුලින් පුංචි ඔබට අසන්නට ලැබෙන ගීත අතරින් ඔබ සඳහා ම නිර්මාණය වී ඇති ගී විශේෂයකි ළමා ගී.සරල නාදමාලා,සරල භාෂාව,දරුවන්ට සමීප තේමා වලින් යුක්ත වීම මේවායෙහි දැකිය හැකි ලක්ෂණයි.ඒ අතරින් පහත ගීය අන්තර්ජාලය භාවිතා කරමින් අසා,ගයා රසවිඳින්න.**

## අම්මා මාව දොයි කරන්න

[ අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි ]
[ හබූන් කටයි කියාලා බත් දෙකටක් කවාලා ]
[ වතුර ටිකක් පොවාලා
උකුල උඩින් දමාලා ]
[ අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි ]

දොයි දොයි දොයි කියාලා
බයි බයි බයි ගයාලා
[ සැනසිල්ලේ හිතාලා නැළවිල්ලක් ගොතාලා ]
[ අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි ]
[ අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි ]
[ ඔන්න බබෝ ඇතින්නී ගල් අරඹේ සිටින්නී ]
[ ගලින් ගලට පනින්නී බබුට බයේ දුවන්නී ]

[ අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි ]
[ හොඳ එළියක් පෙනෙන්නේ හඳ මාමයි එබෙන්නේ ]
[ කිරියි පැණියි ගෙනෙන්නේ මගෙ දූටත් බෙදන්නේ ]

[ අම්මා මාව දොයි කරන්න හදපු හැටි අගෙයි ] //

## ස්වර ප්‍රස්තාරය (අම්මා මාව) (F$^{m}$) 6/8

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| *Intro* | ස+ධ | ම+ස | ම+ධ | ම-- | මස්ස් | නිස්නි | පධප | ම-- |
| | ස+ධ | ම+ස | ම+ධ | ම-- | මස්ස් | නිස්නි | පධප | ම-- |
| | රිරි- | ස්ස්- | නිනි- | ධධ- | ස්නිධ | මපධ | නිපග | ම-- |
| *Chorus* | ග-ම | පධප | මගම | පධප | ධනිධ | පධප | ම-- | --- |
| | ග-ම | පධප | මගම | පධප | ධනිධ | පධප | ම-- | --- |
| | මස්ස් | නිස්නි | ධනිධ | ප-- | ම-නි | ධනිධ | පධප | ම-- |
| | මස්ස් | නිස්නි | ධනිධ | ප-- | ම-නි | ධනිධ | පධප | ම-- |
| | [ පධධ | ධධ- | පධප | ම-- | ප(ධ)ප | (ධ)නි(ධ) | පධප | ම-- ] |
| | [ ග-ම | පධප | මගම | පධප | ධනිධ | පධප | ම-- | --- ] |

*- Inter / Intro -*

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| *Verse* | ග-ම | පධප | මගම | පධප | ධනිධ | පධප | ම-- | --- |
| | ග-ම | පධප | මගම | පධප | ධනිධ | පධප | ම-- | --- |
| | මස්ස් | නිස්නි | ධනිධ | ප-- | ම-නි | ධනිධ | පධප | ම-- |
| | මස්ස් | නිස්නි | ධනිධ | ප-- | ම-නි | ධනිධ | පධප | ම-- |
| | [ පධධ | ධධ- | පධප | ම-- | ප(ධ)ප | (ධ)නි(ධ) | පධප | ම-- ] |
| | [ ග-ම | පධප | මගම | පධප | ධනිධ | පධප | ම-- | --- ] |

*Inter - Verse - Cho - End*

**<u>පැවරුම</u>**

01.ගීතයේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.

02.ගීතය සඳහා භාවිතා කර ඇති සංගීත භාණ්ඩ ලැයිස්තුවක් සකස්කරන්න.

03.ඔබේ අම්මා පිළිබඳ කුඩා කවිපද 04ක් ලියන්න

පැ